**බදුල්ල - චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2021**

බදුල්ල - චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) අනු ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වූ වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, පේරාදෙණිය-බදුල්ල-චෙන්කලාඩි මාර්ගය, බදුල්ල සිට චෙන්කලාඩි දක්වා කිලෝමීටර් 147 ක් ප්‍රතිසංස්කරණය කිරීමෙන් ඌව පළාත සහ මධ්‍යම පළාත සමඟ නැගෙනහිර පළාතේ සම්බන්ධතාව වැඩිදියුණු කිරීම මගින් කලාපයේ ප්‍රවාහනය වැඩිදියුණු කිරීම සහ කලාපයේ ආර්ථික කටයුතු වැඩිදියුණු කිරීමයි. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 18,200 කට සමාන එ.ජ.ඩො. මිලියන 140 ක් වූ අතර ඉන් රු. මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො. මිලියන 60ක් මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල සහ රු. මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො. මිලියන 60 ක් මූල්‍යයනය කිරීමට සංවර්ධනය සඳහා සෞදි අරමුදල විසින් එකඟ වී තිබුණි. ඉතිරි එ.ජ.ඩො. මිලියන 20 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතිය 2017 ජනවාරි 12 වන දින එහි කටයුතු ආරම්භ කර 2021 ජුනි 30 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2022 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳව විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය

සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ට පටහැනිව, ව්‍යාපෘතිය මගින් 2021 වර්ෂය සඳහා අදාළ සිවිල් වැඩ සඳහා අන්තර් ගෙවීම් සහතික 03 ක් සඳහා රු. මිලියන 189.37 ක ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. | ගිණුම් අවසන් කිරීමේදී නිසි තොරතුරු නොමැතිව මෙම බිල්පත් දෙක සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට ඇස්තමේන්තුවකට පැමිණීමට නොහැකි විය. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සහ මහා භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ සංවර්ධනය සඳහා සෞදි අරමුදල (SFD) ණය මුදලේ මුළු ප්‍රතිපාදන රු. මිලියන 2,536.57 ක් භාවිතා කර | මෙම ප්‍රතිපූරණය කළ හැකි විදේශ ණය මුදල් (RFA) මහා භාණ්ඩාගාරය විසින් වියදම් ලෙස සටහන් කර නොමැත. | සැසඳුම් කටයුතු සිදු කළ යුතුයි. |

තිබුණි. කෙසේ වෙතත්, එම මුදල රු. මිලියන 1,425.65 ක් ලෙස විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවල පෙන්නුම් කර තිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල යටතේ ණය මුදලින් කරන ලද මුළු වියදම රු. මිලියන 1,334.8 ක් විය. කෙසේ වෙතත්, එම මුදල විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහ මහා භාණ්ඩාගාරයේ වාර්තාවල පිළිවෙලින් රු. මිලියන 1,282.38 ක් සහ රු. මිලියන 1,282.47 ක් ලෙස පෙන්නුම් කර තිබුණි.

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතුවල භෞතික ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල යටතේ ක්‍රියාත්මක වූ කොන්ත්‍රාත් පැකේජ අංක 03 හි කොන්ත්‍රාත්කරු 2021 ජූලි 12 වන දින වැඩ නවතා තිබූ අතර වැඩ නැවැත්වීමේදී භෞතික ප්‍රගතිය සියයට 60.32 ක් සහ මූල්‍ය ප්‍රගතිය සියයට 55.03 ක් විය. 2022 ජූලි 10 විගණිත දිනට කොන්ත්‍රාත්කරු විසින් වැඩ අත්හැර දමා වසරකට ආසන්න කාලයක් ගත වී තිබුණද, කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවල 15.2 උප වගන්තියට අනුව සේවායෝජකයා විසින් කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබුණි. තවද, කාර්ය සාධන බැඳුම්කරය ද 2022 ජූලි 31 දිනෙන් අවසන් වන බව නිරීක්ෂණය කරන ලදී. | කොන්ත්‍රාත්තුව වසා දැමීමේ ක්‍රියා පටිපාටිය පත් කරන ලද කමිටුව යටතේ සකස් වෙමින් පවතී. | ඉතිරි වැඩ වේගවත් කිරීමට කටයුතු කළ යුතුයි. |

### 3.2 ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා නිලධාරීන්ට රු. මිලියන 1.06 ක දිරි දීමනා ගෙවා තිබුණද, 2021 දෙසැම්බර් 31 වන විටත් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. | කෝවිඩ් ප්‍රශ්නය සහ ඉන්ධන ප්‍රශ්නය ද ප්‍රගතියට බලපාන ලදී. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල යටතේ ක්‍රියාත්මක වූ කොන්ත්‍රාත් පැකේජ අංක 02 සඳහා අවස්ථා 03 කදී වැඩ කොටස් සඳහා පවරා ගැනීමේ සහතික නිකුත් කර ඇති අතර දෝෂ දැනුම්දීමේ කාලය 2022 දෙසැම්බර් 03 දිනෙන් අවසන් වේ. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද ඉතිරි වැඩ ලැයිස්තුව සඳහා අදාළ වැඩසටහන්වලට අනුව, සියලුම වැඩ 2022 මාර්තු 28 වන විට අවසන් කළ යුතුය. කෙසේ වෙතත්, ඉතිරිව ඇති වැඩ සහ දෝෂ සැලකිය යුතු ප්‍රමාණයක් 2022 මැයි 26 දක්වා නිම කර නොමැති බව නිරීක්ෂණය විය. | දායකයා විසින් පසුගිය ජනවාරි මාසයේ සිට කොන්ත්‍රාත්කරුගේ ගෙවීම ලබා දී නොමැති අතර, කොන්ත්‍රාත්කරුට මුදල් ප්‍රවාහ ගැටළුවක් ඇති විය හැකි අතර ඉතිරි වැඩ ලැයිස්තුව සම්පූර්ණ කිරීම ද ප්‍රමාද විය හැකිය. කෙසේ වෙතත්, එය 2022 දෙසැම්බර් 03 වන විට අවසන් වනු ඇත. | ඉටු නොකළ වැඩ සහ අඩුපාඩු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය මත, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල යටතේ ක්‍රියාත්මක වූ කොන්ත්‍රාත් පැකේජ අංක 3 හි ඉතිරි වැඩ සඳහා රු. මිලියන 2,919.56 ක කොන්ත්‍රාත් මුදලකට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට අනුමැතිය ලබා දී තිබුණු අතර එම කොන්ත්‍රාත්තුවල වටිනාකම මුල් කොන්ත්‍රාත් මිල හා සසඳන විට සියයට 107 ක වැඩිවීමක් නියෝජනය කරමින් රු. මිලියන 2,154.37 කින් වැඩි වී ඇති බව නිරීක්ෂණය විය. දුර්වල කාර්යසාධනය, වැඩ ප්‍රමාදයන් සහ කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් රජයට අමතර පිරිවැයක් දැරීමට සිදුවන බව නිරීක්ෂණය විය. | පවතින අනුපාතයට අනුව ඉතිරි වැඩ සඳහා පිරිවැය ඇස්තමේන්තුව මුල් ඇස්තමේන්තුවට වඩා බෙහෙවින් වැඩි ය. | ඉතිරි වැඩ වේගවත් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල යටතේ ක්‍රියාත්මක වූ කොන්ත්‍රාත් පැකේජ අංක 03 යටතේ කොන්ත්‍රාත්කරුගෙන් අයවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 208.67 ක් වූ අතර එය 2022 ජූලි 10 විගණිත දිනය වන විටත් අයකරගෙන නොතිබුණි. තවද, අත්තිකාරම් ගෙවීම් ඇපකරය 2022 අප්‍රේල් 25 දිනෙන් අවසන් වී ඇති බව නිරීක්ෂණය විය. | ඉන්ජිනේරුවරයා විසින් නිකුත් කරන ලද අවසන් සහතිකය අනුව එය සම්පූර්ණයෙන්ම අයකරගෙන ඇත. | අත්තිකාරම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඈ) | ව්‍යාපෘතියේ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල යටතේ ක්‍රියාත්මක වූ කොන්ත්‍රාත්වලට අදාළව ඇස්පෝල්ට් (Asphalt) පිරිවිතර සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අනුකූල නොවන | පැකේජ 02 යටතේ ඇති මහජන පැමිණිලි සම්බන්ධව 2022 දෙසැම්බර් 04 වැනි දිනට එහි දෝෂ | පිරිවිතර අනුව තාර දැමීම සිදු නොවූ කොටස් නිවැරදි කිරීමටත් මහජන පැමිණිලි සඳහා කඩිනමින් පියවර |

| | | | |
|---|---|---|---|
| | වාර්තා 34 න් 04 ක් 2021 දෙසැම්බර් 31 වන විට ද විසඳා නොතිබුණි. තවද, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා OPEC අරමුදල කොටසේ කොන්ත්‍රාත් පැකේජ 02 සහ 03 යටතේ ලැබුනු මහජන පැමිණිලි 806 න් 366 ක් සම්බන්ධව 2021 දෙසැම්බර් 31 දිනට පියවර ගෙන නොතිබුණි. | දැනුම්දීමේ කාල සීමාවට පෙර පියවර ගනු ලැබේ. කොන්ත්‍රාත්කරුගේ අවදානම සම්බන්ධ පැමිණිලි දැනටමත් පැකේජ 03 සඳහා විසඳා ඇත. | ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඉ) | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසිවල 14.6 උප වගන්තියට අනුව, අන්තර් ගෙවීම් සහතිකයේ සහතික කළ වැඩ වටිනාකම, කොන්ත්‍රාත්තුවේ වටිනාකමෙන් සියයට 2 කට වඩා වැඩි විය යුතුය. කෙසේ වෙතත්, අන්තර් ගෙවීම් සහතික අවශ්‍ය සීමාවට වඩා පහළින් ඇගයීමට ලක් වූ අවස්ථා 30 ක් නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්කරුගේ මුදල් ප්‍රවාහය වැඩිදියුණු කිරීම සහ ව්‍යාපෘතියේ ප්‍රතිලාභය සඳහා මෙම ගෙවීම් සිදු කරන ලදී. | කොන්ත්‍රාත් කොන්දේසිවල නියම කර ඇති සීමාවන් පිළිපැදිය යුතු වේ. |
| (ඊ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසි 4.2 උප වගන්තිය යටතේ දක්වා ඇති උපදෙස්වලට පටහැනිව, කොන්ත්‍රාත්කරුවන්ට කාර්ය සාධන ඇපකරය ලබා ගැනීමේ පිරිවැය අයකර ගැනීමට හැකිවන අයුරින් මාර්ග ප්‍රතිසංස්කරණ ප්‍රමාණ පත්‍රවල වෙනම ගෙවීම් අයිතමයක් ඇතුලත් කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරුවන් විසින් ලබාගත් කාර්ය සාධන ඇපකරවල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා රු. මිලියන 84.15 ක අතිරේක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. තවද, 2021 දෙසැම්බර් 31 දක්වාත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනාගත ගිවිසුම් වලින් මෙම අයිතමය ඉවත් කිරීමට අපි තීරණයක් ගෙන ඇත. | ලංසු ලේඛන නිවැරදිව සකස් කළ යුතුය. |